**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

--------------------------

ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව ගිණුම් පිළියෙල කිරීමේදී උපචිත පදනම අනුගමනය කරන බව සඳහන් කර තිබුණද, උසාවි දඩ සහ මුද්දර ගාස්තු මුදල් පදනම මත ගිණුම් තබා තිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී නාගරික තුරු උයන සඳහා මිලදීගෙන තිබුණු රු.907,684 ක් වූ ක්‍රීඩා උපකරණ විෂයයන් 09 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.115,000 ක් වූ VIP හට් කැන්වස් රෙදි තොගය රු.155,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සභාවට අයත් සුසාන භූමි 32 ක්, ක්‍රීඩාපිටි 11 ක්, ඇහැටුවැව සතිපොල ඉඩම, ගල්ගමුව ප්‍රාදේශීය සභා ඉඩම සහ ඉහළගම ජල ව්‍යාපෘති ඉඩම යන ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ඈ) සභාවට අයත් ට්‍රැක්ටරයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම් රු.920,594 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) පොදු වෙළඳපොල කඩ කාමරයකට අදාළව රු.428,555 ක් වූ පෙර ගෙවුම් මුදල් නොගෙවීම මත කඩ කාමරය නැවත සභාවට පවරාගෙන තිබීම හේතුවෙන් ජංගම වත්කම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) තැන්පත් වර්ග 06 කට අදාළ එකතුව රු.32,825 ක් වූ ශේෂ 21 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඍ) රු.6,898,973 ක් වූ හිඟ වරිපනම්, කඩ කුලී, එක්වන් මුදල් (key money), බදු කුලී සහ එම ආදායම් විෂයයන්ට අදාළ රු.78,635 ක කලින් ලැබීම් මූල්‍ය ප්‍රකාශන තුළ හිඟ හා කලින් ලැබීම් ලෙස වෙන් වෙන්ව හෙළිදරව් කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.452,012 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.356,713 ක් ලෙස දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයට අදාළ වැටුප් ප්‍රතිපූර්ණ රු.103,308 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඔ) 2016 පළාත් සභා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වූ කර්මාන්ත ණයගැති ශේෂයේ එකතුව රු.401,264 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමි ශේෂය රු.1,439,878 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට දීමෙන් ලැබියයුතු රු.916,635 ක් හා JCB යන්ත්‍ර කුලියට දීමෙන් ලැබියයුතු රු.54,504 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ග) සභාව සතු වාහන 03 ක් කුලියට දීමට අදාළව එකතුව රු.1,220,827 ක් ලැබී තිබුණද, තවදුරටත් එය ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

(ච) සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් 03 කට අදාළ ආදායම් විෂයයන් 03 ක එකතුව රු.5,450,373 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ජ) ගල්ගමුව පොදු වෙළඳපොල සහ බස්නැවතුම්පල කඩ කාමරවල සමාලෝචිත වර්ෂයට අදාළ රු.84,320 ක් වූ හිඟ විදුලි ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ට) ගිණුම් අතර මුදල් මාරු කිරීමේදී සේවක ණය ගිණුමට සටහන් වියයුතු රු.250,000 ක් අය ශීර්ෂයක් යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් නිවැරදි කළයුතු රු.250,000 ක වෙනසක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

**1.3.3 නොසැසඳුණු ගිණුම්**

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෝටර් ග්‍රේඩර් ණයගැති ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන සමග වූ උපලේඛනය අතර රු.569,339 ක වෙනසක් විය.

(ආ) JCB ණයගැති ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන සමග වූ උපලේඛනය අතර රු.400,651 ක වෙනසක් විය.

(ඇ) තලන රෝල ණයගැති ලේඛනය හා උපලේඛනය අතර රු.79,542 ක වෙනසක් විය.

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

--------------------------------

(අ) ලැබියයුතු ගිණුම්

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට රු.79,892,236 ක්වූ ණයගැතියන්ගෙන් රු.15,963,160 ක් වූ ණයගැති ශේෂ සඳහා කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂයක් හා ඊට වැඩි කාලයක් ඉක්මවා තිබුණ, එකතුව රු.43,484,484 ක්වූ ලැබියයුතු මුදල් අයකර ගැනීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 දෙසැම්බර් 31 දිනට රු.69,305,719 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවලින් රු.1,268,225 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. වර්ෂයක් හා ඊට වැඩි කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.5,364,382 ක් වූ ශේෂ නිරවුල් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ii) 2005 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරාසය තුළ තැන්පත් කර තිබුණු ශේෂ 293 ක එකතුව වූ රු.3,585,614 කින්, ආපසු ගෙවිය හැකි තැන්පත් හඳුනාගෙන ආපසු ගෙවීමට හෝ සභා ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

--------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.16,995,688 ක් වූ ගිණුම් විෂයයන් 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) ජ්නල් සටහන් අංක 14 සහ 15 මගින් පිළිවෙලින් රු.238,271 ක් සහ රු.245,567 ක් සමුච්චිත අරමුදලට හර කිරීමට අදාළ තොරතුරු ඉදිරිපත් නොකෙරුණි.

## 1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) 193 රීතිය | - | එක් එක් ආදායම් හා වියදම් විෂයය යටතේ වන අතිරික්තයන් හා ඉතිරිවීම් පිළිබඳ ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) 218 රීතිය | - | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| 571 (2) | 2,289,646 | වර්ෂ 02 ක කාලයක් ඉක්මවූ තැන්පතු 224 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| (i) 3.4.2 (අ) | | ප්‍රසම්පාදන ක්‍රියාවලිය නියමිත පරිදි අනුගමනය කිරීමකින් තොරව වාහන අළුත්වැඩියාව, ගේට්ටු සෑදීම සහ ග්‍රීස් බැරලයක් මිලදී ගැනීම වැනි කටයුතු සිදුකර තිබුණි. |
| (ii) 6.3.1 (ආ) සහ 7.8.4 (ඇ) | 979,500 | ලංසු ලබාගැනීමේ ක්‍රමවේදය ප්‍රසිද්ධ කර නොතිබුණු අතර, සමහර ලංසු බලයලත් තැනැත්තෙකු/තැනැත්තන් විසින් අත්සන් කර නොතිබුණි. |
| (iii) 3.9.1 | 33,000,000 | වැඩ ඉටු කිරීම සම්බන්ධයෙන් සමිතියේ ධාරිතාවය ගැන සෑහීමකට පත්වීමකින් තොරව ප්‍රජා පාදක සංවිධාන 09 කට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. |
| (iv) 6.3.3 (ආ) | 1,120,500 | ලංසු විවෘත කරන දිනය හා වේලාව ටෙන්ඩර් දැන්වීම්වල සඳහන් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (v) 8.7.1 (ආ) | 229,900 | සැපයීම් සම්බන්ධ මිල ගණන් පිළිගෙන තිබුණද, අදාළ වැඩ/ සැපයුම ලබාදියයුතු දිනයන් සඳහන් කරමින් ලිපි යවා නොතිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**--------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,467,230 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,022,434 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . |
| (I) වරිපනම් හා බදු | 3,380 | 4,290 | 3,349 | 1,050 | 1,170 | 1,127 | 1,192 | 203 |
| (II) බදු කුලී | 22,121 | 19,038 | 16,646 | 2,075 | 28,281 | 21,489 | 14,898 | 1,760 |
| (III) බලපත්‍ර ගාස්තු | 3,340 | 2,367 | 2,361 | 06 | 2,850 | 3,438 | 3,438 | - |
| (IV) වෙනත් ආදායම් | 90,667 | 64,063 | 66,769 | 22,107 | 107,843 | 79,400 | 63,646 | 24,719 |
| එකතුව | 119,508 | 89,758 | 89,125 | 25,238 | 140,144 | 105,454 | 83,174 | 26,682 |

සටහන

---------

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති හිඟයෙන් අයකරගත් ආදායම් සහ සමාලෝචිත වර්ෂයේ බිල් කිරීමෙන් අයකරගත් ආදායම් වෙන් වෙන්ව හඳුනා ගැනීම සඳහා වූ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

-----------------------------------------

සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 119 ක ආදායමක් රැස් කිරීමට ඇස්තමේන්තුගත කර තිබුණද, ඉකුත් වර්ෂයන්ට අදාළව හිඟ ආදායම් ලැබීම්ද ඇතුළුව රුපියල් මිලියන 89 ක් පමණක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 26 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය වන විට රුපියල් මිලියන 25 ක් වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාබල ප්‍රදේශයේ දේපල 652 කින් අයවිය යුතු රු.1,094,420 ක් වූ වරිපනම් බදු ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ දේපල තක්සේරු කිරීමෙන් අනතුරුව 2015 අගෝස්තු සිට 2017 දෙසැම්බර් දක්වා එකතුව වර්ග අඩි 19,991 ක පමණ ගොඩනැගිලි 26 ක් ඉදි කිරීම් සඳහා ගොඩනැගිලි සැලසුම් අනුමත කර තිබුණු අතර එම නව ඉදි කිරීම් සඳහා තාවකාලික තක්සේරු ලබාගෙන වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 කුලී

------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ අයවිය යුතුව තිබුණු රු.446,946 ක් වූ බදුකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අවම ලංසු එකතුව රු. 224,488 ක් වූ බදු දේපල 09 ක් සමාලෝචිත වර්ෂයේ ටෙන්ඩර් කර ලබාදීමට නොහැකි වීමෙන් සභාවට එම ආදායම් අහිමි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති කුලී රු.649,773 කින් 2018 ජූලි මස වනවිටත් රු.142,539 ක් අයවිය යුතුව තිබුණි.

(ඈ) 2013 වර්ෂය අවසන් වනවිට අයවී අවසන් වියයුතු බස්නැවතුම්පල කඩ කාමර 03 කට අදාළ රු.124,000 ක පෙර ගෙවුම් මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ඉ) කඩ කාමර 06 කට අදාළව 2014 මාර්තු වනවිට ලැබියයුතුව තිබුණු රු.2,231,065 ක්වූ පෙර ගෙවුම් මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකරගෙන නොතිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**
-----------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව දුරකථන/විදුලි සංදේශ කුළුණු උස මීටර් 05 සිට 20 දක්වා රු.2,000 සහ උස ඊට වැඩිවන සෑම මීටර් එකකටම රු.100 බැගින් ගාස්තු ගෙවා කුළුණු 20 ක් සඳහා අනුකූලතා සහතික ලබා නොගැනීම නිසා අවම වශයෙන් රු.68,000 ක් සභාවට අහිමි වී තිබුණි.

**2.2.6 වෙනත් ආදායම්**
-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තලන රෝල කුලියට දීමෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,431,227 ක් වූ හිඟ කුලීවලින් වර්ෂ එකකට වැඩි කාලයක සිට හිඟව පවතින රු.1,214,344 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ හිඟ කුලී රු.4,218,691 ක් වූ අතර, වර්ෂ එකකට වැඩි කාලයක සිට හිඟව පවතින රු.3,148,982 සමග සියළු මුදල් අයකර ගැනීමට පියවරගෙන නොතිබුණි.

(ඇ) JCB යන්ත්‍රයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු රු.2,850,953 ක් වූ හිඟ කුලී තුළ වර්ෂයකට වැඩි කාලයක සිට හිඟව පවතින රු.1,725,556 ක් සමග සියළු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**
----------------------------

**3.1 කාර්යය සාධනය**
-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව 2017 දෙසැම්බර් 31 දින වන විට කාරණා 33 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 හා 1988 අගෝස්තු 23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා සභාව විසින් වැළඳගෙන තිබුණි.

(ආ) ඉටු නොකළ කර්තව්‍යන්
---------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම රු.12,000,000 ක් වූ කර්මාන්ත 08 ක් ඉටුකර නොතිබුණි.

(ඇ) අයවැයගත නොකළ කර්තව්‍යයන් ඉටු කිරීම

--------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී රු.10,124,323 ක අයවැයගත නොවූ කර්මාන්ත 15 ක් ඉටුකර තිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ එකතු කරන ලද කසළ ප්‍රමාණය හා පොහොර නිෂ්පාදනය සලකා බැලීමේදී එකතු කරන ලද කසළ ප්‍රමාණය සියයට 30 කින් අඩුවී තිබුණු අතර පොහොර නිෂ්පාදනය සියයට 42 කින් අඩුවී තිබුණි.

(ii) ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට අලි/ඇතුන් ඇතුල්වීම වලක්වා ගැනීම සඳහා යොදා තිබුණු අලි වැට වර්ෂයක පමණ කාලයක සිට අක්‍රියව පැවතුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

"තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" සම්බන්ධයෙන් ලිපි හා පුහුණු වැඩසටහන් මගින් සභාව දැනුවත් වී තිබුණු අතර, ඉදිරියේදී සැලසුම් සකස් කර ඒ අනුව කටයුතු කිරීමට යෝජනා කර තිබුණි. දිළිඳුකම පිටුදැකීම අරමුණු කරගෙන සභාව විසින් දිළිඳු පවුල් සඳහා පොප් කෝන් මැෂින් ලබාදීම, කිරිගව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, වැසිකිලි ආධාර ලබාදීම හා ශිෂ්‍යාධාර ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**---------------------------------**

සභාව සතු ජල බවුසරයකට ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව 2017 ජූලි මාසයේ රු.34,500 කට ජල මෝටරයක් සවිකර තිබුණි. මිලදීගත් දින සිට මෝටරය අක්‍රිය තත්ත්වයට පත්වීම මත 2018 ජනවාරි 12 දින සැපයුම්කරුට එම යන්ත්‍රය ආපසු භාරදී තිබුණද, 2018 මැයි වන විටත් නව මෝටරයක් ගෙන්වාගෙන නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**---------------------------------**

සේවක පුරප්පාඩු හා අතිරික්ත

----------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ පුරප්පාඩු තනතුරු 29 ක් හා අතිරික්ත තනතුරු 01 ක් පැවති අතර අනියම්/ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය වශයෙන් සේවකයන් 04 ක් සේවයේ යොදවාගෙන තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

-------------------------------

### 3.4.1 පවරා නොගත් වත්කම්

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 08 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් නඩත්තු කරනු ලබන සුසාන භූමි 108 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4.2 නිශ්ක්‍රීය වත්කම්

--------------------

සභාව සතුව පවතින රු.6,279,450 ක් වූ මෝටර් රථ 03 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන මාස 04 සිට වර්ෂ 06 දක්වා නිශ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි.

## 3.5 ප්‍රසම්පාදනය

------------------

### 3.5.1 සැපයීම් හා සේවා

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ක්‍රීඩාපිටි 06 කට නාම පුවරු සවි කිරීම සඳහා වූ මිල කැඳවුම් ලිපියේ දිනය, මිල ගණන් ලබාදිය යුතු අවසන් දිනය සඳහන් කර නොතිබුණු අතර ලැබී තිබුණු මිල සැදෑහුම් තුනෙහිම සැපයුම්කරුවන් විසින් යොදා තිබූ දිනය සහ මාසය වෙනස් කර තිබුණි. තවද මිල ගණන් පත්වල සභාවේ දින මුද්‍රාවද එකිනෙකට වෙනස්වීමෙන් එකම දිනකදී විවෘත කර නොතිබුණු බව තහවුරු විය.

(ආ) රු.141,000 ක් වැයකර පරිසර හිතකාමී පුවරු නිර්මාණය, හදිසි ප්‍රසම්පාදනයක් ලෙස සලකා ලංසු කැඳවීම දින 05 කට සීමා කර තිබූ අතර, හදිසි ප්‍රසම්පාදනයක් බවට වූ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2 (අ) ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව සභාව සතු වාහන සඳහා රු.210,000 ක් වටිනා ග්‍රීස් බැරලයක් මිලදීගෙන තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව වාහන අළුත්වැඩියාවන් සිදු කිරීමට අවස්ථාව තිබියදී මිල සැදෑහුම් ව්‍යාජ ලිපි ශීර්ෂ යටතේ සකස් කර එහි සඳහන් මිල ගණන් අනුව ආයතනයක් තෝරාගෙන කැබ් රථයක වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා රු.69,000 ක් වැයකර තිබුණි.

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගල්ගමුව නව බස්නැවතුම්පල පදික වේදිකාවේ අත්වැට සකස් කිරීමේ I හා II අදියරයන් සඳහා රු.979,500 ක් 2017 ඔක්තෝබර් 10 දින හා 2017 නොවැම්බර් 10 දිනයන්හිදී ගෙවීම් කර තිබුණු නමුත් 2018 මාර්තු 15 දින වන විටත් අත්වැටවල් 04 ක් සවිකර නොතිබුණි.

(ආ) 2017 ඔක්තෝබර් 18 දිනට පෙර අවසන් කළයුතුව තිබුණු සභා බල ප්‍රදේශයේ මාර්ග 17 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා 2017 සැප්තැම්බර් 07 දින වන විටත් ප්‍රජා පාදක සංවිධාන සමග විධිමත් පරිදි ගිවිසුම්ගත වී නොතිබුණු අතර සභාව විසින් සම්පූර්ණ නොකරන ලද ගිවිසුම් පත්‍රය, වැඩ විස්තරය හා මිල ලැයිස්තුවට කොන්ත්‍රාත්කරුගෙන් අත්සන් ලබාගෙන තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 3.9.1 වගන්තිය ප්‍රකාරව කිසියම් නිශ්චිත කාලයක් තුළ සමිතියක් විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව 03 කට නොවැඩි වියයුතු අතර දැනටමත් පිරිනමා ඇති කොන්ත්‍රාත්වල ඉතිරි කොටසේ මුළු වටිනාකම සහ යෝජිත කොන්ත්‍රාත් වටිනාකම් එකතුව රුපියල් මිලියන 2 ක් නොඉක්ම වියයුතු වුවද, රුපියල් මිලියන 23.5 ක් වූ කර්මාන්ත 12 ක් ප්‍රජා පාදක සංවිධාන 04 කට ලබාදී තිබුණි.

(ඈ) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධානයක් කොන්ත්‍රාත් 03 කට වඩා වැඩි ප්‍රමාණයක නිරතවීමේදී ප්‍රාදේශීය ලේකම්වරයා/ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ලබාගතයුතු වුවද, අදාළ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගොවි සංවිධාන 02 කට කොන්ත්‍රාත් 4 බැගින් පිරිනමා තිබුණි. ඍජු කොන්ත්‍රාත් පැවරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක නිර්දේශද ලබාගෙන නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-------------------------------------

**4.1 අයවැය පාලනය**

-----------------

සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 07 ක හා වියදම් විෂයයන් 03 ක අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 13 සිට සියයට 84 දක්වා ප්‍රමාණාත්මක විචලතාවයක් මෙන්ම ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව වැය විෂයය සඳහා අයවැයගත සංඛ්‍යා ඉක්මවා රු.1,673,571 ක් වැය දැරීම මත අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය<br>------------ | අඩුපාඩුව<br>------------- |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) වත්කම් ගිණුම්ගත නොකිරීම හා වැරදි ලෙස ගිණුම්ගත කිරීම.<br>(i)<br>(ii) ආදායම් වැරදි ලෙස ගිණුම්ගත කිරීම.<br>(iii) ජංගම වත්කම් හා වගකීම් අඩුවෙන්/වැඩියෙන් ගිණුම්ගත කිරීම.<br>(iv) අත් හැරීමේ දෝෂ.<br>(v) ජංගම වගකීම් වැඩියෙන් ගිණුම්ගත කිරීම.<br>(vi) ලේඛන හා උපලේඛන අතර නොසැසඳීම් පැවතීම හා ලේඛන යාවත්කාලීන නොකිරීම. |
| (ආ) ආදායම් පාලනය | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය | (i) නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම.<br>(ii) වත්කම් තක්සේරු කර ගිණුම්ගත නොකිරීම. |
| (ඇ) අයවැය පාලනය | ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර ප්‍රමාණාත්මක විචලතාවයක් පැවතීම. |
| (ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | (i) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම.<br>(ii) අයවැයගත ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම. |